**ලාහුගල ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

**---------------------------**

1. **<u>මූල්‍ය ප්‍රකාශන</u>**

1.1 **<u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 ජුනි 08 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 03 දින ද විගණනයට ඉදිරිපත්කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 අප්‍රේල් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

**1.2** **<u>මතය</u>**

මාගේ පරික්ෂණයෙන් පෙනි යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ලාහුගල ප්‍රාදේශිය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සදහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට ලාහුගල ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිලිබද තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සදහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මුලධර්මවලට අනුකුලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වු මතය වේ.

1.3 **<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.</u>**

1.3.1 **<u>ගිණුම් ප්‍රතිපත්ති.</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) හිඟ ආදායම් ගිණුම් ගත කිරීම් සම්බන්ධයෙන් ප්‍රතිපත්තියක් අනුගමනය කර නොතිබුණි.

(ආ) වරෙන්තු ගාස්තු සහ දඩ මුදල්, මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

1.3.2 **<u>ගිණුම්කරණ අඩුපාඩු.</u>**

(අ) බැංකු ගිණුම් අංක 6162300 හි 2011 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව,මුදල් පොතේ ශේෂය රු.327,863 ක් වූවත් මූල්‍ය ප්‍රකාශන වල රු.265,713 ලෙස දක්වා තිබුණෙන් රු.62,150 ක වෙනසක් දක්නට ලැබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව බැංකු ගාස්තු රු.1,500 ක් සහ මුදල් පොතේ සඳහන් නොවූ ගෙවීම් රු.20,000 ක් වර්ෂයේ වියදම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබූ අතර බැංකු සැසඳුම් ප්‍රකාශයෙන් ගලපා තිබුණි. තවද රු. 497,168 ක් වූ ලදුපත් නිකුත් නොකල තැන්පතු මූල්‍ය ප්‍රකාශනවලට නොගෙන ඉහත පරිදිම බැංකු සැසඳුම් ප්‍රකාශයේ ගලපා තිබුණි.

(ඇ) සභාවට අයත් ට්‍රැක්ටරයේ සහ ටේලරයේ වටිනාකම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඈ) ආදායම් හා වියදම් ගිණුමෙහි මූලධන ආධාර රු.3,369,634 ක් ප්‍රාග්ධන වත්කම් විකුණුම් ලෙස දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ මුදල් ආදායම රු.746,833 ක් වුවත් , රු.1,221,184 ක් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණෙන් වර්ෂයේ උසාවි දඩ මුදල් ආදායම රු. 474,351 කින් වැඩියෙන් දක්වා තිබුණි.තවද 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු රු.746,833 ක උසාවි දඩ මුදල මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල රු. 4,000 ක මුද්දර ගාස්තු ආදායම වර්ෂයේ ආදායමක් වශයෙන් ආදායම් හා වියදම් ගිණුමට ගෙන ශේෂ පත්‍රයේ හිඟ හිටි ආදායමක් වශයෙන් ගිණුම් ගත කල යුතු වුවද එසේ කර නොතිබුණි.

**1.3.3** <u>විගණනය සඳහා සාක්ෂි නොවීම.</u>

(අ) <u>පිළිතුරු නොලත් විගණන විමසුම්</u>

2013 මැයි 09 වන දින වන විට විගණන විමසුම් 02 කට පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.එකී විමසුම් වලට භාජනය වූ ගනුදෙනු වල ගණනය කල හැකි වටිනාකම රු.2,419,067 ක් විය.

(ආ) <u>තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.16,909,173 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

2. <u>මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය</u>

## 2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය.</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අදායම රු.257,700 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.1,437,550 ක් විය.

## 2.2 මූල්‍ය පරිපාලනය

### 2.2.1 බැංකු ගිණුම්

දීර්ඝ කාලයක් තිස්සේ උපලබ්ධි නොවූ රු.77,056 ක් වූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතුකර නොතිබුණි.

### 2.2.2 අක්‍රීය බැංකු ගිණුම්.

පහත සඳහන් බැංකු ගිණුම් වසර කිහිපයක් පුරා අක්‍රීය තත්වයේ පැවැතුණි.

| ගිණුම් | දෙසැම්බර් 31 දිනට ශේෂය<br>රු. | අක්‍රීයව පවතින කාලය |
|---|---|---|
| (i) මහජන බැංකුව - පොතුවිල් 1766 | (49,201) | 2007.01.01සිට |
| (ii) ලංකා බැංකුව - පොතුවිල් 6864096 | 5,947 | 2010.01.01 සිට |
| (iii) ලංකා බැංකුව - මොණරාගල 1446 | 7,408 | 1999 පෙර සිට |

## 2.3 ආදායම් පරිපාලනය

### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|

| | | රු. | රු. | රු. |
|---|---|---|---|---|
| (i) | කුළී | 375,000 | 169,124 | - |
| (ii) | බලපත්‍ර ගාස්තු | 128,350 | 137,489 | - |
| (iii) | වරෙන්තු හා දඩ මුදල් | 461,950 | 1,224,184 | - |
| (iv) | වෙනත් ආදායම් | 114,150 | 6,745 | 26,763 |

**2.3.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම් වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබු මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 746,833 |
| (ii) | මුද්දර ගාස්තු | 4,000 |

**2.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

(අ) සභාවේ දැනට භාවිතාකරන කැබ්රථ 03 ක්ද ට්‍රැක්ටර් 04 ක් හා ට්‍රේලර් 04 ක් සභාවේ නමින් පවරා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ආ) දේශීය ණය හා සංවර්ධන අරමුදලට ගෙවිය යුතු රු.33,198 ක මුදල ගිවිසුම් ප්‍රකාරව ගෙවීමට කටයුතු කර නොතිබුණි.

**3. පද්ධති හා පාලන.**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය